මහ/ ශ්‍රී රාහුල විද්‍යාලය - කටුගස්තොට

පළමු වාර පරීක්ෂණය - 2020

සංගීතය I කොටස 11 ශ්‍රේණිය

නම :.................................................................... වි.අංකය:............................ කාලය පැ.1 යි.

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. සර්ව කෝමළ රාගයක් ලෙස සංගීතයේ හඳුනාගත හැකි රාගය වන්නේ,
1. භූපාලි 2. යමන් 3. භෛරවි 4. කාෆි

02. නිරි ගරි සස නිරි / ගම' පම' ගරි සස / යන තානාලංකාරය අයත් රාගය වන්නේ,
1. බිලාවල් 2. කාෆි 3. භූපාලි 4. යමන්

03. එක් ආවර්තයක් අවසානයේ මාත්‍රා 10 ක් සහ 16ක් යෙදෙන තාල 2 පිළිවෙලින් සඳහන් වරණය තෝරන්න.
1. ජප් තාලය, දීප්චන්දි තාලය 2. දාදරා තාලය, ජප් තාලය
3. ත්‍රිතාලය, කෙහෙර්වා තාලය 4. ජප් තාලය, ත්‍රිතාලය

04. සම්පර්ණ ජාති රාග යුගලයකි
1. කාෆි, භීම්පලා ශ්‍රී 2. භීම්පලා ශ්‍රී, යමන්
3. භූපාලි, බිලාවල් 4. කාෆි, යමන්

05. එක් ස්වරයක් පමණක් විකෘතිව යෙදෙන රාගය කුමක්ද ?
1. භූපාලි 2. බිලාවල් 3. භෛරවි 4. යමන්

06. පහත සඳහන් ගීත අතරින් සුනිල් ශාන්ත මහතා විසින් ගායනා නොකළ ගීතය ඇතුළත් වරනය තෝරන්න.
1. එන්නද මැණිකේ මමත් දියඹට 2. ලංකා ලංකා
3. කෝකිලයන්ගේ කෝකිල නාදේ 4. ඕලු පිපිලා

07. ''තෑර ඉස්ති තෑර'' යන ගීතයේ නාද මාලාවට අනුව නිර්මාණය කරන ලද සිංහල ගීතය වන්නේ,
1. රස ආහාර කවලා 2. මී වදයකි ජීවිතේ
3. ලස්සනට පිපිණු වනමල් 4. අයිරින් ජොසපින් රොසලින්

08. හින්දුස්ථානි සංගීත භාණ්ඩයක් වන සිතාරය වාදනය කරනු ලබන කුඩා උපකරණය හඳුන්වන්නේ,
1. අළුව 2. පික් එක 3. මිස්රාබය 4. කඩිප්පුව

09. පියගුණ කියැවෙන ගීතයක් වන ''අන්දර යායේ වැව් තාවුල්ලේ'' යන ගීතය ගායනා කරන්නේ,
1. පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේව 2. රෝහණ වීරසිංහ
3. ආනන්ද සමරකෝන් 4. කරුණාරත්න දිවුල්ගනේ

10. සේ ගී වල විශේෂ ලක්ෂණයකි
1. භාව සරලය 2. මුඛ පරම්පරාවෙව් පැවතිණි
3. නිර්මාණකරුවෙකු ඇත 4. ගීත ඒකාකාරිය



Created by Universal Document Converter

11. විද්‍යුත් අවනද්ධ වාද්‍ය භාණ්ඩයක් වන්නේ,
1. විදුලි ඕගනය 2. ඔක්ටපෑඩය 3. ලීඩ් ගිටාරය 4. වයලීනය

12. පංච තූර්ය භාණ්ඩ වර්ගයට අයත් නොවන්නේ,
1. තබ්ලාව 2. දවුල 3. තම්මැට්ටම 4. හොරණෑව

❖ අංක 13 සිට 18 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත සඳහන් ස්වර පාද යොදාගන්න.

| | | | | |
|---|---|---|---|---|
| A | ස ස ග ග | රි රි ග - | ස ස රි රි | ග - - - |
| B | ග ප ධ නි | ස - ධ ප | ම ග ම රි | ස රි ස - |
| C | ස ස රි රි | ග රි ස - | රි රි ම ම | ප - - - |
| D | ග රි ග රි | ස රි ස ධ | - ස - රි | ග - - - |
| E | ස ම ම ම | ම - - - | ම ධ ප ම | ග - මග රි |

13. කෝමළ ස්වර සහිත ස්ථාපන ගීතය වන්නේ,
1. A 2. B 3. C 4. D

14. ඖඩාව ජාති රාගයට අයත් වන්නේ,
1. B 2. C 3. D 4. E

15. ගැමි ගී විශේෂයකි
1. B 2. C 3. C 4. E

16. ශුද්ධ ස්වර ස්ථාපන ගීතයකි
1. A 2. B 3. C 4. D

17. සගර්මි ගීතයට අයත් ගී පාදය වන්නේ
1. A 2. B 3. C 4. D

18. මධ්‍යලය ගීතයක ගී පාදය වන්නේ,
1. A 2. C 3. B 4. D

19. ස්වර සප්තකය මධ්‍යම භාවයන් ලියු විට විකෘති ස්වරයක් ලෙස යෙදෙන්නේ,
1. කෝමළ නිශාදය 2. කෝමළ ධෛවතය
3. කෝමළ ගාන්ධාරය 4. තීව්‍ර මධ්‍යමය

20. කැලිප්සෝ ගීත සඳහා භාවිතා නොවන වාද්‍ය භාණ්ඩය තෝරන්න.
1. ගිටාරය 2. වයලීනය 3. ටැම්බරීන් 4. මරකාස්

21. උකුසා වන්නම සඳහා යොදාගත් තාලය වන්නේ,
1. මැදුම් මහ දෙතති 2. සුළු මැදුම් දෙතති
3. මහ තනි තිත 4. මැදුම් තනි තිත

22. තබ්ලාවේ නිර්මාතෘවරයා සහ එය නිමැවීමට පදනම් වූ භාණ්ඩය කුමක්ද ?
1. රවීන්ද්‍රනාත් ඨාගෝර් පක්වාජය 2. රවි ශංකර් පක්වාජය
3. අමීර් ඛුෂ්රෑ - පක්වාජය 4. ශකීර් හුසේන් පක්වාජය



Created by Universal Document Converter

23. පහතරට වන්නම්වල ප්‍රධාන අංගයන්ට අයත් නොවන්නේ,

1. තානම 2. ඉරට්ටිය 3. කවිය 4. කලාසම

24. ''රතු හැට්ටකාරී'' නාට්‍යයේ එන ගීතයක් වන්නේ

1. සෝබාව දේ මෙපුර 2. දී කිරි දී කිරි ගෙනාව
3. යස ඉසුරු පිරුණ තැනා 4. සුවඳ සබන් ඇඟ ගාලා

25. පහත වගුව ඇසුරින් අංක 25 සිට 28 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| නොංචි අක්කා | දුටු ගැමුණු | අන්දරේලා | ඉයුජින් |
| මුදලි | වෙස්සන්තර | කුස පබාවතී | බැලසන්ත |
| ජසයා | පද්මාවතී | රතු හැට්ටකාරී | හරිශ්චන්ද්‍ර |
| ලෙන්ඩිනා | ශ්‍රී වික්‍රම රාජසිංහ | තාරාවෝ ඉගිලෙති | ඇහැලේපොල |

26. ඉහත වගුවේ A B C D තීරුවල ඇතුළත් කරුණුවලට අදාළ රංග සම්ප්‍රදායන් මොනවාද ?

1. නාඩගම්, කෝළම්, නව නාට්‍ය, නූර්ති
2. කෝලම්, නාඩගම්, නූර්ති, නව නාට්‍ය
3. නූර්ති, නව නාට්‍ය, නාඩගම්, කෝලම්
4. කෝලම්, නූර්ත, නව නාට්‍ය, නාඩගම්

27. වාදනය සඳහා පහතරට බෙරය යොදාගනු ලබන රංග සම්ප්‍රදායන් ඇතුළත් තීරුව කුමක්ද ?

1. A තීරුව 2. B තීරුව 3. C තීරුව 4. D තීරුව

28. D තීරුවට අයත් නාට්‍ය ඇතුළත් රංග සම්ප්‍රදායට අයත් නොවන ගීතාංගයක් වන්නේ,

1. උරුට්ටුව ය 2. තෝඩායම ය
3. ඉන්නිසථ 4. දොහොරාව ය

29. සමූහ වාදනයක දී වයලීනය, සිතාරය, එස්රාජය, බටනලාව ආදී සංගීත භාණ්ඩවල හඬ වෙන් කොට හඳුනාගත හැකි වන්නෙ,

1. විපුලතාවය නිසා ය 2. තාරතාවය නිසා ය
3. ධ්වනි ගුණය නිසා ය 4. හඬේ සැර නිසාය

30. ප්‍රශස්ති ගායනාවන්හි අඩංගු සුවිශේෂී ගායන අංගය වන්නේ,

1. මුදුප් පදයයි 2. සීරු මාරුවයි 3. කස්තිරමයි 4. අඩව්වයි

31. සමාජ ගී ගණයට අයත් වන්නේ,

1. රබන් ගී 2. තුන්සරණේ ගී
3. පැල් ගී 4. බඹර කැපීමේ ගී

32. ගීත නාට්‍යය ගණයට අයත් වන්නේ,

1. හුණුවටය 2. මානස විල 3. හංස විල 4. දෙපානෝ

33. ශෛලිගත හා අර්ධ ශෛලිගත නාට්‍ය වගර් දෙකේම ලකෂණ මිශ්‍ර වූ නාට්‍යයකි

1. මනමේ 2. සිංහබාහු 3. නරිබෑනා 4. කුණ්ඩලකේසී



Created by Universal Document Converter

34. ලෝක ප්‍රසිද්ධ බටනලා වාදකයෙක් වන්නේ,

1. ශකීර් හුසේන්  2. හරිප්‍රසාද් චෞරසියා
3. රවි ශංකර්  4. ජග්ජිත් සිං

35. ඔපෙරා ශෛලියේ නාට්‍යයකි

1. මානස විල  2. කුවේනි  3. සිංහබාහු  4. කුණ්ඩලකේසි

36. නූර්ති ගායනයේ දි ඊට ඇතුලත් සුවිශේෂී අංගයක් වන්නේ

1. ආලාපය  2. උරුට්ටුව  3. මුද්‍රප්පදය  4. දොහොරාව

37. පහතරට සින්දු වන්නමකට අයත් ආරම්භක ගී පදය කුමක්ද ?

1. සදවා සුදදුවැලි පිවිතුරු  2. අප ගුණ සරු සිංහල භූපති
3. සේතව් පාද සරෝරුහ සංරිතයෝ ඉතා  4. රන්රසා සේම වඩන

38. හෙළ ගී මග නම් කෘතිය කළ දේශීය සංගීතඥයා

1. ලයනල් රන්වල මහතා  2. ඩබ්.බී. මකුලොළුව මහතා
3. රෝහණ බැද්දගේ මහතා  4. සි ද එස් කුලතිලක මහතා

39. ගීතය ගායනය අතරතුර උරුට්ටුව නම් කොටසක් ගැයෙන ගී විශේෂය ඇතුලත් වන්නේ,

1. නූර්ති  2. ඔපෙරා  3. නාගඩම්  4. නව නාට්‍ය

40. ත්‍රි තාලය ආවර්ත දෙකක් සම්පූර්ණ වූ විට ලැබෙන මාත්‍රා ගණන

1. 12 කි  2. 24 කි  3. 32 කි  4. 44 කි



Created by Universal Document Converter

මහ/ ශ්‍රී රාහුල විද්‍යාලය - කටුගස්තොට

පළමු වාර පරීක්ෂණය - 2020

සංගීතය　　II කොටස　　11 ශ්‍රේණිය

❖ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු ලියන්න.

01. i. මධ්‍යමය වාදි හා සංවාදි ලෙස යෙදෙන රාගය නම් කරන්න.
ii. වයලින් පවුලට අයත් ප්‍රමාණයේන විශලාතම භාණ්ඩය කුමක්ද ?
iii. ලංකාවේ නිෂ්පාදිත පළමු සිංහල නූර්තිය සහ එහි නිෂ්පාදකවරයා නම් කරන්න.
iv. එක් ආවර්තයක දී මාත්‍රා 14 ක් සම්පර්ණ වන හින්දුස්ථානි තාලය ලියා දක්වන්න.
v. කපිරිඤ්ඤා ගීත නිර්මාණය සඳහා බහුලව යොදාගන්නා ලද තාලය නම් කරන්න.
vi. ''කලිඳු ගංගා දෙණියේ වන තීරේ'' යන ගීතය සඳහා පාදක කොටගෙන ඇති රාගය කුමක්ද ?
vii. උඩරට වන්නම් සහ සබරගමු වන්නම් සඳහා භාවිත වන අවනද්ධ වාද්‍ය භාණ්ඩ දෙක පිළිවෙලින් ලියා දක්වන්න.
viii. ''සිරි බුද්ධ ගයා විහාරේ යන ගීතය ග්‍රැමෆෝන් තැටි යුගයේ කුමන යුගයට අයත් දැයි ලියා දක්වන්න.
ix. 1925 දී ආරම්භ වූ ගුවන් විදුලිය සඳහා මුල් කාලයේ ගීත නිර්මාණය කරන ලද සංගීතඥයන් 2 ක් නම් කරන්න.
x. සමුද්‍රඝොෂ විරිතට අනුව ගායනා කරන ගීයක් නම් කර එය ජන ගී වර්ගීකරණයේ අයත් වන ගී වර්ගය ලියා දක්වන්න.

02. i. මාඩව සම්පර්ණ ජාති රාගයක් නම් කර ඊට අදාළ මධ්‍යලය ගී/ලක්ෂණ ගී සර්ගම් ගි යන ගීත වලින් එකක ස්ථායි කොටස ස්වර ප්‍රස්ථාර කරන්න.
ii. කාෆි රාගයේ මධ්‍යලය ගී 4 ලක්ෂණ ගී / සර්ගම් ගී යන ගීත වලින් එකක අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කරන්න.

03. i. පහත ලැයිස්තුවේ ගීත අදාළ තාලවලට ගැළපෙන පරි දිනැවත සකසා ලියන්න.

දාදරා → සඳවතී
දාදරා → ලංකා ලංකා පෙම්බර

ත්‍රිතාල් → අඳුර අඳුර මගේ
ත්‍රිතාල් → රන් මලක් ලෙස

දීප්චන්දි → මනහර ගීත නාද ඇසේ
දීප්චන්දි → ඕලු පිපිලා විල ලෙල දෙනවා

කෙහෙර්වා → දුර පෙනෙන තැනිතලා
කෙහෙර්වා → සිනහවෙන් හෝ කතාවෙන් බෑ



Created by Universal Document Converter

ii. නිර්දේශිත මාත්‍රා 10 ක් යෙදෙන හින්දුස්ථානි තාලය හා එයට ගැළපෙන දේශීය තිත් රූපය නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

04. i. ගැමි ගී හා සේ ගී පිළිබඳව උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
ii. ආඝාතාත්මක ගොයම් ගියක් පද ප්‍රස්තාර කරන්න.

05. i. නාඩගම් සංගීතයේ හා නූර්ති සංගීතයේ ඇති වෙනස්කම් 4 ක් ලියන්න.
ii. තබ්ලාවේ මුහුණත් 2 ඇඳ පහත සඳහන් අක්ෂර නිකුත් වෙන තැන් ලකුණු කරන්න.
නා, තා, තිං, තූ, ගෙ, ග, කි, ක

06. i. මාත්‍රා 10 ක ා මාත්‍රා 16 ක හින්දුස්ථානි තාල 2 ක් නියමිත තාල යොදා සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.
ii. බෙම්ටෝ තාලයට අයත් ගී පාදයක් පද ප්‍රස්තාර කරන්න.

07. i. කමත් ගී, නෙළුම් ගී, දරු නැළවිලි ගී, තුන්සරනේ ගී යන ගී අතරින් එකක් තෝරා එම ගීතයේ ගීත හා ස්වර ප්‍රස්තාර කරන්න.
ii. එම ගීතයේ සංස්කෘතික පසුබිම ලියන්න.
iii. ඉහත ගීත ජන ගී වර්ගීකරණය අනුව සමාජ ගී, ඇදහිලි හා විශ්වාස මත යෙදෙන ගීත වෘත්තිමය ජන ගී වශයෙන බෙදා දක්වන්න.

07. i. පහත සඳහන් පෙරදිග ස්වර ප්‍රස්තාරය බටහිර ක්‍රමයට ලියා දක්වන්න.

+ ග රි ස / නි රි ස - / ප ම ග රි / ග - - - /
නි රි ග ම / ප ම ග ප / රි - ග රි 4 ස - - - /

ii. බටහිර සංගීතයේ භාවිතා වන පහත සඳහන් සංකේත ඇඳ දක්වන්න.
(අ) ට්‍රෙබල් ක්ලේෆ් (Table cleff)
(ආ) ෂාප් (Sharp)
(ඇ) ෆ්ලැට් (Flat)
(ඈ) ඩොටඩ් මිනිම් (Dotted Minim)
(ඉ) සෙමිබ්‍රේව් රෙස්ට් (Semibrave Rest)



Created by Universal Document Converter